# අඩු විදුලි බිලකට මඟ

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

# අඩු විදුලි බිලකට මඟ



**අඩු විදුලි  බිලක් සඳහා අප අඳුරේ සිටිය යුතු නැත.**

**විදුලි උපකරණ භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු ද නැත.**

ඒ සඳහා අවශ්‍ය වන්නේ

අවශ්‍යතාව මත කාර්යක්ෂමව
විදුලි බලය භාවිතා කිරීම පමණායි.

ඒ සඳහා අප දැනුවත් වෙමු.

**උපදේශකත්වය**

**ඉංජිනේරු රංජිත් සේපාල මයා**
සභාපති - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**අතුල ජයතුංග මයා**
අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**හර්ෂ වික්‍රමසිංහ මයා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉල්ලුම් පාර්ශවීය) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**විමල් නදීර මයා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැපයුම් පාර්ශවීය) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**චමිල ජයසේකර මයා**
අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**පි. පී. කේ. විජේතුංග මයා**
අධ්‍යක්ෂ (ප්‍රචාරණ හා ප්‍රවර්ධන) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**සම්පාදනය**

**චමින්ද ලියනගේ මයා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ධාරිතා සංවර්ධන) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**සහය සම්පාදනය**

**අනුරුද්ධ එදිරිවීර මයා**
සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය සම්බන්ධතා හා ප්‍රවර්ධන) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**නිමල්කා සමරකෝන් මිය**
කණිෂ්ඨ කළමණාකාර (මාධ්‍ය) - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**පරිගණක අක්ෂර සංයෝජනය**

**සින්දිකා ප්‍රියංගනී මිය**
කළමණාකරණ සහකාර - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

**චිත්‍ර හා පිටු සැකසුම**
**සසංක දසනායක** (The Graphic mill)

**තෙවන මුද්‍රණය 2022 ඔක්තෝම්බර්**

# බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කළ යුත්තේ ඇයි?

ගින්දර පාලනය කරමින් තම දෛනික අවශ්‍යතාව සඳහා ශක්තිය භාවිතා කිරීමත් සමඟ ආරම්භ වන මානව බලශක්ති වංශකතාව දහන ක්‍රියාවලිය සඳහා පොසිල ඉන්ධන භාවිතයත් සමඟ නව මගකට යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ජන ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී ඇති පොසිල ඉන්ධන ලෝක ආර්ථික හා දේශපාලන ක්‍රියාවලියේ ගාමක බලවේගය බවට පත්ව ඇත. එසේ වුවද වසර මිලියන ගණනක ස්වාභාවික ක්‍රියාවලීන්වල ප්‍රතිඵලයක් ලෙස නිධිගත වූ ඉන්ධන සංචිත මේ සියවසේ දී අවසන් වීමට නියමිතය. එය මානව ශිෂ්ටාචාරයේ අවසානය සනිටුහන් කිරීමට තරම් ප්‍රබල සාධකයක් ද වනු ඇත.

තවද ඉවක් බවක් නොමැතිව පොසිල ඉන්ධන භාවිතය හේතුවෙන් වායුගෝලයට නිදහස් වන හරිතාගාර වායූන් නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යයි. මෙය හේතුකොට ගෙන ඇතිවී ඇති පාරිසරික ගැටලු ඉදිරි දශක කීපය තුළ උත්සන්න වීමත්, පෘථිවි උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 2කින් ඉහළ ගියහොත් ඇතිවන පාරිසරික ව්‍යසනයන් හා උණුසුම දරාගත නොහැකිව මානවයා ද ඇතුළු තවත් බොහෝ ජීවීන් පෘථිවියෙන් සදහටම තුරන් වී යෑමේ අවදානම අප හමුවේ ඇති ප්‍රධාන අභියෝගයන් වේ.

මෙපමණක් නොව දේශීය බලශක්ති පරිභෝජනයෙන් 40%ක් පමණ ආනයනික බොරතෙල් මත රඳාපැවතීම නිසා වාර්ෂිකව ඇ.ඩො. බිලියන 5.5ක් පමණ රජයට දැරීමට සිදුවීම දේශීය ආර්ථිකයට විශාල වශයෙන් බලපායි. එමෙන්ම මේ ආනයනික බොරතෙල් වලින් 25%ක් පමණ විදුලි නිෂ්පාදනයට වැයවන අතර, ඒ සඳහා වාර්ෂිකව ඇ. ඩො. මිලියන 1.37ක් පමණ වැයවේ. ඉහත කී ජාතික සහ ගෝලීය ගැටලුවලට විසඳුමක් ලෙසත්, පෞද්ගලිකව අපගේ බලශක්ති වියදම් අඩුකර ගැනීම සඳහාත් නැණවත් ලෙස බලශක්තිය භාවිතා කිරීමත් වැදගත් වේ. මේ පොත් පිංච ඒ සඳහා අවැසි දැනුම ඔබට නොඅඩුව ලබා දේ.

# නිවසේ සිසිලසට මුදල් ගෙවමුද ?

බොහෝ දෙනෙක් නිවාසයක් තනන්නේ ජීවිත කාලයටම එකක් පමණි. එසේ ගොඩ නගන නිවස තුළ සුව පහසු ජීවිතයක් ගත කිරීම මූලික අරමුණයි. ඒ සඳහා නිවසේ සිසිල අත්‍යාවශ්‍ය බව අමුතුවෙන් කිව යුතු නැත. ඒ සිසිලස ස්වභාවිකවම ලබාගත හැකි නම් එය සැබෑ සිසිලසක් නොවේ ද?



## වාස්තු විද්‍යාඥයා සමඟ කතාබහ කරමු:

ඔබ නිවසක් ඉදිකිරීම සඳහා අදහස් කරයි නම් ඔබේ වාස්තු විද්‍යාඥයා සමඟ නිවසේ බලශක්ති සංරක්ෂණය පිළිබඳව කතා කරන්න. එවිට නිවසේ ජීවත්වන තුරාවට විදුලි බිල ඔබට බරක් නොවනු ඇත.

## උතුරට හා දකුණට වැඩි ජනෙල් දොරවල් ප්‍රමාණයක් යොදමු

නැගෙනහිර දිසාවට ජනෙල් යෙදීමෙන් නිවස තුළට සෘජුවම ආලෝකය පෙරවරු කාලයේ ලැබෙන බැවින් නිවස තුළ වාතය රත් වේ. එමෙන්ම බටහිරට ජනෙල් යෙදීමෙන් සවස් කාලයේ එම තත්ත්වයම ඇති වේ. එමෙන්ම ආලෝකය ලැබෙන්නේත් උදෑසන නැගෙනහිර දිසාවට පමණක් හා සවසට බටහිර දිසාවට පමණි. දවසේ වැඩි කාලයක් නිවසට උපරිම ආලෝකය ලබාගැනීමටත්, උපරිම සිසිල රඳවා ගැනීමටත්, උතුරැ හා දකුණු දිසා සඳහා වැඩි ජනෙල් ප්‍රමාණයක් යොදන්න.

## ජනෙල් අසල ගස්කොළන් වවමු :

නිවසේ ජනෙල් අසල ගස් කොළන් වවා ඒවා නිසි ලෙස නඩත්තු කිරීම තුළින් නිවස තුළට ගලා එන වාතය වඩාත් සිසිල්ව දැනෙනු ඇත. මුළු නිවසට සෙවණ සැලසෙන ලෙස තුරුලතා පිහිටා ඇත්නම් නිවසේ උෂ්ණත්වය $2^{0}C$ වැනි ප්‍රමාණයකින් අඩු කර ගත හැක.

## ජනේල සඳහා ලූවර් යෙදීම :

නිවසෙහි අභ්‍යන්තර උෂ්ණත්වය ඉහළ යනු ලබන එක් හේතුවක් වන්නේ නිවසේ ජීවත්වන පුද්ගලයන්ගේ ශරීරයෙන් පිටවන උෂ්ණත්වයයි. මෙසේ උණුසුම් වන වාතයේ ඝනත්වය අඩු වී එම වාතය ඉහළ යයි. එවිට පහළින් ඝනත්වය වැඩි වාතය ඇතුළට පැමිණය යුතු ය. ඒ සඳහා ජනෙල් පියනකට ඉහළින් පමණක් ලූවර් හෝ වා කවුළු යෙදීමෙන් සිසිල් වාතය ළඟා කර ගත නොහැක. ඒ සඳහා ජනේලයේ පහළ කොටසේ හෝ ඉහළ සිට පහළ දක්වාම ලූවර් යෙදීම වැදගත් වේ.

# කාර්යක්ෂම ආලෝකකරණය විදුලි බිලට සහනයකි

නිවසේ විදුලි බිලෙන් 30% - 40% ක් වැය වන්නේ ආලෝකකරණය සඳහා යි. එය අඩු කරගැනීමට නම්,

පළමුව නිවස ආලෝකකරණයේ දී ස්වභාවික ආලෝකය දවසේ වැඩි කාලයක් භාවිතා කිරීමට හුරුවීම ඉතා වැදගත් ය.

## නිවසේ බිත්ති ලා වර්ණ ගන්වමු:

- නිවසේ ඇතුළත බිත්ති ලා වර්ණ ගැන්වීම තුළින් අඩු වොට් ප්‍රමාණයකින් වැඩි ආලෝකයක් ලබාගත හැකි වනු ඇත.
- දොර ජනෙල් සඳහා තිර රෙදි තෝරා ගැනීමේදි ද ලා වර්ණ වැඩි වශයෙන් භාවිතා කරන්න.
- සුදු පැහැති සිවිලිම් මගින් කෘත්‍රිම ආලෝකය මෙන්ම දිවා ආලෝකය ද නිවස තුළ රඳවා ගැනීමට දායක වේ. වාර්නිෂ් කරන ලද ලී සිවිලිම් සහ පැනලිං නිවසට මහත් අඳුරක් ගෙන දේ.

## විදුලි පහන් භාවිතය:


හැම විටම සූත්‍රිකා (සාමාන්‍ය) විදුලි පහන් වෙනුවට සුසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන් (CFL), ප්‍රතිදීප්ත විදුලි පහන් හෙවත් ටියුබ්ලයිට් (Fluorescent Light) හෝ LED විදුලි පහන් මිලදී ගන්න. එවිට ඔබේ නිවසේ ආලෝකකරණය සඳහා වැය වන විදුලි ඒකක ගණනින් 80% ක් පමණ ඉතිරි කර ගත හැකි වේ.

| විදුලි පහන් වර්ගය | වොට් ගණන | මාසික විදුලි ඒකක ගණන | දැල්වෙන පැය ගණන | ආයු කාලය පැය |
|---|---|---|---|---|
| සූත්‍රිකා | 100 | 12 | 4 | 2000 |
| CFL | 20 | 2.4 | 4 | 6000 |
| LED | 13 | 1.6 | 4 | 40000 |

සැ.යු: සූත්‍රිකා විදුලි පහනට වඩා පස් ගුණයක විදුලි ඉතිරියක් ටියුබ්ලයිට් හා CFL විදුලි පහන් වල ඇත.


මිල අධික වුවත් CFL විදුලි පහනක මෙන් හත් ගුණයක පමණ ආයු කාලයක් LED විදුලි පහන් සතු වේ.

## CFL මිල දී ගැනීමේ දී:




CFL විදුලි පහන්හි කාර්යක්ෂමතාව මත, ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ව බලශක්ති කාර්යක්ෂමතා ලේබලයක් හඳුන්වාදී ඇත. එම ලේබලයේ තරු ලකුණු 5ක් දක්වා ඇති අතර, තරු වැඩි වන තරමට කාර්යක්ෂමතාවය වැඩි වේ. එම නිසා CFL මිලදී ගැනීමේ දී ඉහත සඳහන් බලශක්ති ලේබලය ඇත්දැයි විමසිලිමත් වන්න. ලේබල් නොමැති CFL පහන් තොග පවත්වාගෙන යාම සහ විකිණීම නීතිය හමුවේ දඬුවම් ලැබිය හැකි වරදකි.

## LED මිල දී ගැනීමේ දී:




LED සඳහා ද අවම බලශක්ති කාර්ය සාධන (MEP) ලේබලයක් හඳුන්වා දී ඇත. LED බල්බ සඳහා මෙම ලේබලය තිබීම අනිවාර්ය අවශ්‍යතාවක් වන අතර, මෙම ලේබලය රහිත LED බල්බ ශ්‍රී ලංකාව තුළ විකිණීම තහනම් කර ඇත. බල්බයේ, ආලෝක කාර්යක්ෂමතා අගය ලේබලය මධ්‍යයේ EFFICACY ලෙස සඳහන් කර ඇත. මෙම අගය වැඩිවන විට ඔබට වැඩි ආලෝකයක් මෙන්ම අඩු විදුලි බිලකටද මඟ පෑදෙනු ඇත.

## ටියුබ් ලයිට් මිලදී ගන්නා විටः

ටියුබ් ලයිට් මිලදී ගන්නා විට ටියුබය සිහින් වන තරමට එහි කාර්යක්ෂමතාව වැඩි බව මතක තබා ගන්න. අඩි 4ක ටියුබයක් සඳහා වොට් 40ක් වැය වේ. ඉන් වොට් 100ක ආලෝකයක් ලබා දුන්න ද ටියුබය සිහින් වන තරමට වැයවන විදුලිය ප්‍රමාණය වොට් 40 සිට 28 දක්වා අඩු වේ. නමුත් ආලෝකය සමානය. අද වෙළඳපළේ විවිධ විශ්කම්භයන් සහිත ටියුබ් ලයිට් දක්නට ලැබෙන අතර, එකම ආලෝකය නිකුත් කරන විවිධ වර්ගයේ ටියුබ් ලයිට්වල බලශක්ති ධාරිතාව පහත වගුවේ සටහන්ව ඇත.

| විශ්කම්භය අඟල් | වැය වන වොට් ගණන | වර්ගය |
|---|---|---|
| 1.25" මහත ටියුබය | 40 W | T10 |
| 1" සිහින් ටියුබය | 36 W | T8 |
| 5/8" ඉතා සිහින් ටියුබය | 26 W | T5 |

මේ අනුව T 5 සිහින් ටියුබය සඳහා වැය වන්නේ වොට් 26ක් පමණි. එම නිසා T 5 ටියුබ් බල්බය මිලදීගැනීම වඩා කාර්යක්ෂම ආලෝකයකට මඟපාදයි.

## තුලබරු (චෝක්) Ballast




ටියුබ් ලයිට් සඳහා භාවිතා කරනු ලබන තුලබරු දෙවර්ගයකි.

| තුලබරු වර්ගය | වැය වන වොට් ගණන |
|---|---|
| මැග්නටික් | 12-20 W |
| ඉලෙක්ට්‍රොනික් | 1-4 W |

මේ අනුව ටියුබ් ලයිට් සඳහා ඉලෙක්ට්‍රොනික් තුලබරු භාවිතා කිරීම වඩා කාර්යක්ෂම වේ.

## පාඩම් කිරීමට ආලෝකය:

රාත්‍රි කාලයට පාඩම් කිරීමට ආලෝකය ලූමන්ස් 250-300 අතර ප්‍රමාණයක් අවශ්‍ය වේ. ඔබ පාඩම් කරන විට කාමරයේ සීලිමේ ඇති විදුලි පහන මගින් එම ආලෝක ප්‍රමාණය ගැනීමට නම් වැඩි වොට් ප්‍රමාණයක විදුලි පහන් අවශ්‍ය වනු ඇත.



නමුත් මේස විදුලි පහනක් භාවිතා කිරීමෙන් මේසය මතට අවශ්‍ය ආලෝකය අඩු වොට් ප්‍රමාණයකින් ලබාගත හැකි වේ. මේ සඳහා ඉතා සුදුසු වොට් 5 ප්‍රමාණයේ යටිකුරු (Down light) LED පහන් වන අතර, එම පහන් දැන් වෙළෙඳපළේ සුලබව ඇත.

## කාමරවල විදුලි බලය :

නිවසක කෙතරම් කාමර තිබුණද නිතර විදුලි පහන් දැල්වෙන එක් කාමරයක් ඇත. එම කාමරය සඳහා අනිවාර්යයෙන්ම LED හෝ CFL පහනක් භාවිතා කරන්න.

කාමරයෙන් පිටවන අවස්ථාවේ, එහි විදුලි පහන, විදුලි පංකා හා වායුසමන යන්ත්‍රය ක්‍රියාත්මක වේ නම් නිවා දමන්න.

# විදුලි බිලෙන් හරි අඩක්ම ශීතකරණයට

ශීතකරණයක් ඔබේ නිවසට අත්‍යවශ්‍ය ද? මොහොතක් හිතන්න. ශීතකරණයෙන් නිවසේ විදුලි බිල දෙගුණ වේ. එසේ වැඩි වන මුදල් ප්‍රමාණයට සාපේක්ෂව ශීතකරණයෙන් ඔබට ප්‍රයෝජනයක් ඇද්ද?

අප කළ සමීක්ෂණ අනුව ලංකාවේ බොහොමයක් නිවාසවල ඇති ශීතකරණ තුළ ඇත්තේ වතුර බෝතල්, බීම බෝතලයක්, පලා මිටියක් වැනි අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය කීපයක් පමණි. නමුත් ඔවුන් ඒ සඳහා රු. 500ත් 750ත් අතර මුදලක් මාසිකව විදුලි බිලට වැය කරයි.



## ශීතකරණයක් මිලදී ගන්නා විට :




**ශීතකරණය සඳහා වන 'අවම බලශක්ති කාර්ය සාධන' (MEP) ලේබලය**

තනි දොර සහ දොර දෙක හෝ තුන ලෙස ගෘහස්ථ ශීතකරණ සදහා කාර්යක්‍ෂමතාව හඳුනා ගැනීම සඳහා "අවම බලශක්ති කාර්ය සාධන (MEP) ලේබලය" ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය එක්ව හඳුන්වා දී ඇත. එබැවින් ශීතකරණයක් මිලදී ගැනීමේදී බලශක්ති කාර්යක්‍ෂම ශීතකරණයක් සඳහා MEP ලේබලය ඇත්දැයි බලන්න. මෙම ලේබලය මධ්‍යයේ 'ENERGY PERFORMANCE' ලෙස සඳහන් කර ඇති අගය අඩුවන විට එම ශීතකරණයේ බලශක්ති කාර්යක්‍ෂමතාව වැඩි වේ.

තනි දොර, දොර දෙක ශීතකරණය මෙරට නිවෙස් තුළ බහුලව භාවිතා වන අතර, දොර දෙක ශීතකරණය වල බලශක්ති පරිභෝජනය තනි දොර ශීතකරණවලට වඩා වැඩි අගයක් පවතී.

ශීතකරණයේ පරිමාව වැඩි වනවිට වැඩි විදුලි ඒකක ප්‍රමාණයක් වැය වන බැවින් ශීතකරණයක් මිලදී ගන්නාවිට තමාට අවශ්‍ය පරිමානයෙන් යුතු ශීතකරණයක් මිලදී ගැනීම වාසිදායක වේ.

| **ශීතකරණයේ ප්‍රමාණය** | **වැයවන වොට් ගණන** (W) | **මාසික විදුලි ඒකක ගණන** (kWh) |
|---|---|---|
| තනි දොර ශීතකරණයක් | 70-100 | 38-54 |
| දොර දෙක ශීතකරණයක් | 125-140 | 67-75 |
| දොර තුන ශීතකරණයක් | 140-180 | 75-97 |

- කාර්යක්‍ෂම ශීතකරණය දිනකට ක්‍රියාත්මක වන්නේ පැය 18 කට අඩුවෙන් බැවින් එම කාලය අනුව ඉහත ගණනය කර ඇත.

ඔබ ශීතකරණය මිලදී ගන්නා විට අවශ්‍යතාව අනුව අඩු වොට් ප්‍රමාණයක් සහිත ශීතකරණයක් මිලදී ගැනීමට උනන්දුවන්න. තව ද ස්වයංක්‍රීයව අයිස් දියවන ශීතකරණ ඉතා වැඩි ශක්ති ප්‍රමාණයක් භාවිතා කරන බව ද, ඉන්වර්ටර් යෙදූ ශීතකරණ සාමාන්‍ය ශීතකරණයට වඩා අඩුවෙන් විදුලිය භාවිතා කරන බව ද සිහි තබාගත යුතුය.

## පරිසර උෂ්ණත්වය ශීතකරණය අකාර්යක්ෂම කරයි :

- ශීතකරණය ස්ථානගත කිරීමේ දී බිත්තිය හා ශීතකරණය පිටුපස අතර අඟල් 10 ක් හෝ ඊට වැඩි පරතරයක් සිටින සේ තබන්න.
- ශීතකරණය අසල රත්වන උපකරණ හෝ ආහාර පිසින උදුන් භාවිතයෙන් වළකින්න.
- හිරු එළිය සෘජුව නොවැටෙන ස්ථානයක ශීතකරණය තබන්න.
- උණුසුම් ආහාර ශීතකරණයේ තැබීමට පෙර නිවෙන්නට සලස්වන්න.

## ශීතකරණයේ කාර්යක්ෂමතාවයට

- ආහාර අසුරන විට ඒ ඒ ද්‍රව්‍ය සඳහා වෙන් වූ ස්ථානවල ආහාර ඇසිරීම වැදගත් වේ.
- තෙත සහිත ආහාර ශීතකරණයේ තබන විට ඒවා පොලිතින් උරවල බහා හෝ ඔතා තැබීම කාර්යක්ෂමතාවට හේතු වේ.
- ආහාර එකිනෙකට තදබද නොවන සේ ලිහිල්ව තබමු. ඒවා ශීතකරණයේ පහළ කොටසේ තැබීමෙන් එහි අයිස් දියවෙන අතර, සිසිලස ඉවත්වන විට තාපය උරාගන්නා බැවින් ශීතකරණයේ වැයවන ශක්තිය අඩු කර ගත හැක.
- ශීතකරණයේ ඇති භාණ්ඩ පිළිබඳ ලැයිස්තුවක් දොරේ අලවා තැබීමෙන් හෝ මතකයේ තබා ගැනීමෙන් එහි දොර ඇර තබාගෙන භාණ්ඩ සෙවීමට ගතවන කාලය අවම කර ගත හැක.
- ශීතකරණයේ දොර ඇරෙන වැහෙන වාර ගණන අඩු කර ගැනීමෙන් වැය වන විදුලිය අඩු කර ගත හැක.
- ශීත කිරීමට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය නොමැති විට එය ක්‍රියා විරහිත කර තැබීම ද ඔබේ විදුලි බිල අඩු කර ගැනීමට හේතුවනු ඇත.

## නඩත්තුවත් වැදගත් :

- ශීතකරණයේ කාර්යක්ෂමතාවයට එහි නඩත්තුව ඉතා වැදගත් වේ.
- ශිතකරණයේ ඇති රබර් බීඩිම පලුදු වී ඇත්නම් හෝ ඝන වී ඇත්නම් එය අලුතින් දමන්න.
- දොර ඉහළ පැත්තේ රබර් බීඩිම තුළට අපද්‍රව්‍ය හෝ සහල්, සීනි වැනි ද්‍රව්‍යය වැටී ඇත්නම් එම බීඩිම පිරිසිදු කරන්න.
- ශීතකරණයේ පිටුපස ඇති, ජලය එක් රැස්වන භාජනයේ ජලය සතියකට වරක් ඉවත් කර එම භාජනය හොඳින් සෝදන්න. එය අද දවසේ ඇති ඩෙංගු අවදානමෙන් මිදීමට හේතුවනු ඇත.

# වායුසමනය - ගතට සුවයකි; හිතට ගින්දරකි

වායුසමන යන්ත්‍රය යනු නිවසක ඉතා ඉහළම විදුලි පරිභෝජනයක් සහිත විදුලි උපකරණයකි. කාමරයක සවි කරන කුඩා වායුසමන යන්ත්‍රයක් සාමාන්‍යයෙන් වොට් 1000-1300 තරම් විදුලි පරිභෝජනයක් සිදු කරයි.

එවැනි යන්ත්‍රයක් රාත්‍රී පැය 8ක පමණ භාවිතා කළහොත් එම නිවසේ විදුලි බිලට ඒකක 240-310 අතර ප්‍රමාණයක් එක් වේ.



හැකි සෑම විටම නිවසේ සිසිලස ස්වභාවිකව ලබා ගැනීමටත්, විදුලි පංකා මගින් අවශ්‍ය සිසිලස රඳවා ගැනීමටත් උනන්දු වීම පෞද්ගලිකව මෙන්ම ජාතික ආර්ථිකයට ද මහත් පිටුබලයකි.

## වායුසමනයේ කාර්යක්ෂමතාව උදෙසා

වායු සමනය භාවිතා කරන විට උෂ්ණත්වය $26^{0}$ C ට තබාගන්න. එක් අංශකයක් අඩු කිරීම තුළින් විදුලිය භාවිතය 4% කින් වැඩි වේ.

හිරු රැස් වායුසමන කාමර තුළට කෙළින්ම වැටීම වැළැක්වීම සඳහා අවට ගස් කොළන් වවා නඩත්තු කරන්න.

වායුසමනය කර ඇති ප්‍රදේශ තුළ දොර ජනෙල් හොඳින් වසා ඇතුළත සිසිල් වාතය කාන්දු වීම වළක්වන්න.

වායුසමන යන්ත්‍රයෙන් පිටවන වායු ධාරාවට බාධාවන සේ භාණ්ඩ තැන්පත් කිරීමෙන් හා තාපය මුදාහැරෙන විදුලි උපකරණ වායුසමන ප්‍රදේශ තුළ භාවිත කිරීමෙන් වළකින්න.


තාපය මුදාහැරෙන එළිමහනට විවෘත කොටස් ද අවහිරයකින් තොරව මනා තත්ත්වයෙන් තබාගත යුතුය.

# විදුලි පංකා ගැන දැන ගනිමු

විදුලි පංකා කීපයක් වෙළෙඳපළේ දක්නට ඇත. එම විදුලි පංකා සඳහා වැය වන විදුලි ඒකක ගණන පහත පරිදි වේ.

| පංකා වර්ගය | වොට් ගණන (W) | දිනකට පැය 4 බැගින් භාවිතා කළ විට වැයවන මාසික විදුලි ඒකක ගණන (kWh) | රාත්‍රී නින්දේදී පැය 8 ක් භාවිතා කළ විට දිනකට වැයවන විදුලි ඒකක ගණන (kWh) |
|---|---|---|---|
| සීළිං විදුලි පංකා | 75-80 | 9-9.6 | 0.6-0.64 |
| මේස විදුලි පංකා | 35-50 | 4.2-6 | 0.28-0.4 |
| සිටුවා තබන විදුලි පංකා | 35-50 | 4.2-6 | 0.28-0.4 |
| බිත්ති විදුලි පංකා | 35-50 | 4.2-6 | 0.28-0.4 |

## සීළිං විදුලි පංකා




සීළිං විදුලි පංකා සඳහා මේ වනවිට බලක්ති කාර්යක්ෂමතා ලේබලයක් හඳුන්වාදී ඇති අතර, ශ්‍රී ලංකාව තුළ විකුණන සෑම සීළිං විදුලි පංකාවක් සඳහාම මෙම ලේබලය තිබීම අනිවාර්ය වේ.

එම ලේබලයේ ඇති තරු ලකුණු වැඩිවන තරමට විදුලි පංකාවේ කාර්යක්ෂමතාවද වැඩි වේ. එබැවින් සීළිං විදුලි පංකාවක් මිලදී ගැනීමේදී තරු ලකුණු වැඩි විදුලි පංකාවක් මිලදී ගන්න.

තරු ලකුණු 5ක් සහිත සීළිං විදුලි පංකාවක්, දිනකට පැය 8ක් බැගින් භාවිතා කිරීමේදී මසකට කිලෝවොට් පැය 12ක (12kWh) විදුලි ඒකක ප්‍රමාණයක් ඉතිරි කර ගතහැකි බව ගණනය කර ඇත.



ඉහත විදුලි පංකා වර්ග අනුව සීළිං විදුලි පංකා සඳහා වැයවන විදුලි ප්‍රමාණය අනෙකුත් විදුලි පංකා සඳහා වැය වන විදුලි ප්‍රමාණයට සාපේක්ෂව දෙගුණයක් පමණ වේ. එහෙයින් හැකි සෑම විටම අඩු විදුලි වැයවීමක් සහිත විදුලි පංකා භාවිතා කරන්න.

## මේ ගැනත් සිතන්න :

නිවසක් අලුතින් වයරින් කරන විට කාමර වැනි කුඩා වර්ගඵලයක් සහිත ස්ථාන සඳහා බිත්ති විදුලි පංකා සවිකිරීමට කටයුතු කරන්න.

ඕනෑම විදුලි පංකාවක් මිල දී ගන්නා විට එහි සුළං වේගය මෙන්ම එහි සඳහන් වොට් ගණන පිළිබඳව ද සැලකිලිමත් වන්න.

ඩිමර් මාදිලියේ පාලක උපකරණ විදුලි පංකා සඳහා වඩාත් සුදුසු මෙන්ම කාර්යක්ෂමතාවය ද ඉහළ නංවයි.

# සිත නිවෙන්න රෙදි මදින්න

නිවසකට විදුලි බලය ලැබුණ විට කුප්පිලාම්පුව ඉවත්ව විදුලි පහන දැල්වූවා මෙන්ම පොල්කටු ස්ත්‍රික්කය වෙනුවට විදුලි ස්ත්‍රික්කය ආදේශ නොවූ නිවසක් දක්නට නැත.



## කාර්යක්ෂම විදුලි ස්ත්‍රික්කයක් තෝරමු :

වෙළෙඳපළේ විදුලි ස්ත්‍රික්ක වර්ග තුනක් දක්නට ඇත.

| | | |
|---|---|---|
| 1) සාමාන්‍ය විදුලි ස්ත්‍රික්ක | - | 750 W - 1000 W |
| 2) ජලය විදිය හැකි විදුලි ස්ත්‍රික්ක | - | 750 W - 1200 W |
| 3) ජල වාෂ්ප පිටකරන විදුලි ස්ත්‍රික්ක | - | 1200 W - 2400 W |

පාසල් සඳහා යන දරුවන් සිටින හෝ රැකියා සඳහා යන පුද්ගලයන් සිටින නිවසක බොහෝ විට දිනපතා විනාඩි 20 ත් 30 ත් අතර කාලයක්, රෙදි මැදීම සඳහා වැය කරයි. ඒ අනුව නිවසක විදුලි බිලට විදුලි ඒකක 8 ත් 24 ත් අතර ප්‍රමාණයක් මෙමඟින් එක් වේ.

ඉහත සඳහන් වර්ග තුනෙන් වොට් ගණන වැඩි වුවත් ජල වාෂ්ප පිටකරන විදුලි ස්ත්‍රික්ක ඵලදායිතාවෙන් ඉහළය. එමනිසා විශාල වශයෙන් රෙදි මැදීම කරනු ලබන වැඩි පිරිසක් වාසය කරන පවුලකට මෙම ස්ත්‍රික්කය වඩාත් සුදුසු වේ.

ජල වාෂ්ප විදිය හැකි නිසා රෙදි මැදීමේ දී වැඩිපුර පොඩි වී ඇති ස්ථාන එක් වරකින් මැදිය හැක. එම නිසා කාලය ගතවීම සාමාන්‍ය ස්ත්‍රික්කයට වඩා 50% කින් අඩු වේ.

සාමාන්‍ය ස්ත්‍රික්කයක වොට් ගණන අඩු වුවත් ඉන් රෙදි මැදීමට ගතවන කාලය හා එය රත්වීමට ගතවන කාලය වැඩි බැවින් එය අනෙක් ස්ත්‍රික්ක හා සැසඳීමේ දී වැඩි විදුලියක් පරිභෝජනය කරයි.

රෙදි මැදීම ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා වන කාලය අවම කර ගැනීම බලශක්ති සංරක්ෂණයට වැදගත් වේ. එහෙයින් රෙදි මැදීම ආරම්භ කිරීමට ප්‍රථම රෙදි එල්ලීම සඳහා රෙදි එල්ලීමේ රාමු (Hangers) සූදානම් කරගන්න. ස්ත්‍රික්ක කිරීම අත්‍යාවශ්‍ය හා සුළු වශයෙන් මැදිය යුතු ඇඳුම් වෙන් කරන්න.

## ස්ත්‍රික්කයේ කාර්යක්ෂමතාව උදෙසා :

- අමු කෙසෙල් කොලයක් මැදීමෙන් පතුල පිරිසිදු කර ගන්න
- වාෂ්ප ස්ත්‍රික්ක සඳහා ආසවනය කළ (Distilled) ජලය පාවිච්චි කරන්න.
- ජල වාෂ්ප පිටවන සිදුරු අවහිරවීම වැළැක්වීම සඳහා නිෂ්පාදකයන්ගේ උපදෙස් පිළිපදින්න.
- පුළුන් කැබැල්ලකින් නිතර වාෂ්ප සිදුරු පිරිසිදු කරන්න.

## රෙදි මැදීමත් පිළිවෙළට :

- රෙදි මැදීමට පෙර රෙදිවල ඝනකම අනුව වර්ග කරගන්න.
- ඝනකම රෙදිවලින් මැදීම ආරම්භ කර අවසානයට තුනී රෙදි මැදීම කරන්න. ඒ අනුව ස්ත්‍රික්කයේ උෂ්ණත්ව පාලකය ක්‍රමානුකූලව අඩු කරන්න.
- අවසන් රෙදි කීපය ස්ත්‍රික්ක කිරීමට පෙර ස්ත්‍රික්කයේ විදුලිය විසන්ධි කරන්න.
- රෙදි මැදීම අතරතුර ස්ත්‍රික්කය පසෙකින් තබන විට එහි පතුළ සිරස්ව තබන්න.
- විශේෂයෙන් සාමාන්‍ය ස්ත්‍රික්කයක් ඇති විට සතියක රෙදි එකවර මැදීමට පුරුදු වන්න.
- රෙදි මැදීමේ දි මේස කවරයට යටින් තුනී ඇලුමිනියම් ෆොයිලයන් යොදන්න. එවිට රෙදිවල දෙපැත්තම එකවිට හොඳින් මැදගත හැක.

# රෙදි සේදීමත් ව්‍යායාමයක්:

රෙදි සේදීම දෑතින් සිදු කිරීම ශරීර සෞඛ්‍යයට හිතකර වුවත් වර්තමානයේ විශේෂයෙන් නාගරික නිවාස තුළ ඒ සඳහා රෙදි සෝදන යන්ත්‍ර භාවිතයට ගැනීමේ නැඹුරුතාව ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත් එය අපගේ විදුලි බිලට බරක් නොවන්නට වගබලා ගනිමු.

## රෙදි සෝදන යන්ත්‍රයක් මිල දී ගන්නා විට :

රෙදි සෝදන යන්ත්‍රයක් මිල දී ගැනීමට ප්‍රථම නිවසේ අවශ්‍යතාව පිළිබඳවත්, නිවසේ ජීවත්වන පුද්ගලයන් ප්‍රමාණයත් පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. පුද්ගලයන් 3 ත් 4 ත් ඇති නිවසකට කිලෝ ග්‍රෑම් 4 ක ධාරිතාවයෙන් යුත් යන්ත්‍රයක් සෑහේ. ඒ අනුව ඔබේ නිවසේ පුද්ගලයින් ප්‍රමාණය අනුව යන්ත්‍රයේ ප්‍රමාණය තීරණය කරන්න.



රෙදි සෝදන යන්ත්‍ර ස්වයංක්‍රීය (Automatic) හා අර්ධ ස්වයංක්‍රීය (Semi automatic) ලෙස දෙවර්ගයක් ඇති අතර, ස්වයංක්‍රීය යන්ත්‍ර සඳහා සාපේක්ෂව වැඩි විදුලියක් වැය වේ.

වෙළෙඳපළේ රෙදි සෝදන යන්ත්‍ර දෙයාකාරයකින් දක්නට ඇත. එනම් යන්ත්‍රයේ ඉහළින් රෙදි ඇතුල් කරන (Top loading) හා ඉදිරිපසින් රෙදි ඇතුල් කරන (Front loading) යන්ත්‍ර ලෙසය. ඉන් ඉදිරිපසින් රෙදි ඇතුල් කරන යන්ත්‍ර වඩා කාර්යක්ෂමය. කෙසේ වෙතත් රෙදි සේදීමේ යන්ත්‍රයකට වොට් 1500 ක් පමණ විදුලි බලයක් වැය වේ. මෙවැනි යන්ත්‍රයකින් රෙදි සේදීමේ දී එක් වාරයකට විදුලි ඒකක 2 ක් පමණ වැය වන හෙයින් හැකි සෑම විටම එහි උපරිම ධාරිතාවයට ආසන්න ප්‍රමාණයක් රෙදි ඇතුළු කිරීමට යෝග්‍යයි.

## කාර්යක්ෂම රෙදි සේදීමකට :

**අර්ධ ස්වයංක්‍රීය**
(Semi automatic)



**ස්වයංක්‍රීය**
(Automatic)



**ඉහළින් රෙදි ඇතුල් කරන**
(Top loading)



**ඉදිරිපසින් රෙදි ඇතුල් කරන**
(Front loading)

- උපකරණයේ සඳහන් බර ප්‍රමාණයට සරිලන ප්‍රමාණයෙන් රෙදි යොදන්න.
- බර වැඩි වූ විට රෙදි නිසියාකාරව නොසේදෙන අතර, යන්ත්‍රයේ මෝටරයට ද හානිවිය හැක.
- සඳහන් ප්‍රමාණයට වඩා අඩු බර රෙදි ප්‍රමාණයක් සේදීම ද අකාර්යක්ෂම භාවිතයකි.
- රෙදි ප්‍රමාණයට සරිලන ප්‍රමාණයෙන් ජලය භාවිතා කරන්න.
- රෙදි අනවශ්‍ය වාර ගණනක් සහ අනවශ්‍ය කාලයක් සේදීමෙන් වළකින්න.
- රෙදි වේලීම සඳහා වොට් 500 ක  පමණ විදුලියක් වැය වේ. එබැවින් හැකි සෑම විටම රෙදි අව්වේ වේලාගන්න.
- රෙදි සෝදා වේලීමට එල්ලන විට සහ වියළීමෙන් පසු අසුරා තැබීමේ දී රෙදි පොඩි නොවන ලෙස (හැන්ගර්ස් භාවිතා කර) තැන්පත් කිරීමෙන් රෙදි මැදීම සඳහා වැය වන විදුලිය මෙන්ම කාලය ද ඉතිරි කර ගත හැක.

# විදුලි බිලට නොදැනෙන්න විනෝද වෙමු

ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකුගේ විනෝදාස්වාදය උදෙසා භාවිතා කරන ප්‍රධාන මෙවලම රූපවාහිනියයි. ලක්ෂ 45 ක් පමණ වූ විදුලි බලය ඇති නිවාස වල පමණක් නොව, විදුලිය නොමැති නිවාසවල ද බැටරි බලයෙන් ක්‍රියාත්මක වන රූපවාහිනියක් හෝ දක්නට ඇති බව නොරහසකි.

## රූපවාහිනියක් මිලදී ගනිමු :

රූපවාහිනියක් මිල දී ගන්නා විට එහි ප්‍රමාණය නැත්නම් අඟල් ගණන පිළිබඳව පමණක් නොව, ඒ සඳහා වැයවන විදුලි ප්‍රමාණය කොතෙක් ද යන්න පිළිබඳව ද විමසිලිමත් වන්න.

| රූපවාහිනි වර්ගය | රූපවාහිනියේ ප්‍රමාණය | වොට් ගණන (W) | දිනකට පැය 4 ක් පාවිච්චි කළ විට වැය වන විදුලි ඒකක ගණන (kWh) |
|---|---|---|---|
| සාමාන්‍ය කළු සුදු | අඟල් 14 | 40 | 4.8 |
| සාමාන්‍ය වර්ණ | අඟල් 21 | 100 | 12 |
| LCD | අඟල් 22 | 48 | 5.7 |
| LED | අඟල් 24 | 28 | 3.3 |

රූපවාහිනි වෙළඳ නාමය අනුව ඉහත වැයවන වොට් ගණන සුළු වශයෙන් වෙනස් වේ.

නවීන තාක්ෂණ අනුව නිෂ්පාදනය වී ඇති, LED හා LCD රූපවාහිනි සඳහා අඩු විදුලි ප්‍රමාණයක් වැය වන බව ඉහත වගුව අනුව පැහැදිලි වේ. එම නිසා රූපවාහිනියක් මිලදී ගන්නා විට නවීන LED හෝ LCD රූපවාහිනියක් ගැනීම විදුලි බිලට සහනයකි.

## රූපවාහිනි නැරඹීම :

- රූපවාහිනිය නරඹන විට නිවසේ අනෙකුත් අත්‍යාවශ්‍ය නොවන ස්ථානවල විදුලි පහන් නිවා දමන්න.
- දුරස්ථ පාලකය (Remote control) මගින් ක්‍රියාවිරහිත කිරීමෙන් (Stand by

තත්ත්වයේ තැබීමෙන්) සාමාන්‍යයෙන් වොට් 10 ත් 18 ත් අතර විදුලි බලයක් වැය වේ. එම නිසා රූපවාහිනිය නරඹා අවසානයේ එහි ස්විචයෙන් හෝ බිත්තියේ ස්විචයෙන් පමණක් ක්‍රියාවිරහිත කරන්න. දුරස්ථ පාලකය චැනල් මාරු කිරීමට පමණක් භාවිතා කරන්න.

- මෙය රූපවාහිනියට පමණක් නොව, කැසට් යන්ත්‍ර හා DVD, CD යන්ත්‍ර සඳහා ද අනුගමනය කරන්න.
- දෛනික රූපවාහිනි වැඩසටහන් විස්තරය මතකයේ තබාගන්න. එවිට අනවශ්‍ය අවස්ථාවලදී නිකරුණේ රූපවාහිනිය ක්‍රියාත්මක කිරීමෙන් වැළකිය හැක.
- නිවසේ පාළුව මඟහැරීම සඳහා ගුවන් විදුලිය ඉතා හොඳ මාධ්‍යයක් බැවින් ඒ සඳහා රූපවාහිනී යන්ත්‍ර යොදාගැනීමෙන් ඉවත්වන්න.



# විදුලි උපකරණ මිලදී ගන්නා විට මේ ගැන සිතමු

අද අපේ රටේ බොහොමයක් පුද්ගලයින් විදුලි උපකරණ මිලදී ගැනීමට පෙළඹෙන්නේ පහසු ගෙවීමේ ක්‍රමයට ලබාදෙන බැවින් හා සේල් ක්‍රමයට මිල අඩු කර ලබාදෙන බවට වන ප්‍රචාරය හමුවේ මුලා වීමෙනි.

නමුත් අප විශේෂයෙන් විදුලි උපකරණ මිලදී ගත යුත්තේ අපගේ අවශ්‍යතාවය, එම අවශ්‍යතාවයට ගැළපෙන භාණ්ඩයේ ප්‍රමාණය හා ආයු කාලය තුළ එම භාණ්ඩය වෙනුවෙන් දැරිය යුතු පිරිවැය පිළිබඳ විමසා බැලීමෙනි. එසේ නොමැතිව ලාභයට ලැබෙන නිසාවෙන් හෝ ගෙවීමේ ක්‍රමයට ලැබෙන නිසාවෙන් විදුලි උපකරණ මිල දී ගැනීමෙන් එම උපකරණය භාවිතා කරන කාලය තුළ දී අපගේ මුදල් නිකරුණේ වියදම් වේ.

## ආයු කාලය තුළ දරනු ලබන පිරිවැය (Life cycle cost)



**ආයු කාලය තුළ දරනු ලබන භාණ්ඩයේ මුළු පිරිවැය = උපකරණයේ මිල + බලශක්ති වියදම + නඩත්තු වියදම**

උදාහරණයක් ඇසුරින් ආයු කාලය තුළ දරනු ලබන පිරිවැය ගණනය කරමු.

**සූත්‍රිකා හා සුසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන් සඳහා ආයු කාලය තුළ දරන පිරිවැය (Life cycle cost) සැසඳීම**

පැය 40,000 ක කාලයක් ආලෝකය ලබාගැනීම සඳහා ඔබ LED විදුලි පහනක් භාවිතා කරනු ලබන්නේ නම් එහි ආයු කාලය පැය 40,000 ක් පමණ වන බැවින් මේ සඳහා එක බල්බයක් සෑහේ. CFL විදුලි පහන් භාවිතා කරන්නේ නම් එක් බල්බයක ආයු කාලය පැය 8000 ක් පමණ වන බැවින් මෙම කාලය තුළ බල්බ 5 ක් භාවිතා කළ යුතු වේ. එමෙන්ම සූත්‍රිකා විදුලි පහන් භාවිතා කරන්නේ නම් එක් බල්බයක ආයු කාලය පැය 2000 ක් පමණ වන බැවින් මෙම කාලය තුළ බල්බ 20 ක් භාවිතා කළ යුතු වේ.

| | | සූත්‍රිකා විදුලි පහන (75 W) | CFL විදුලි පහන (15 W) | LED විදුලි පහන (12 W) |
|---|---|---|---|---|
| 1) | ආයු කාලය (පැය) | 2000 | 8000 | 40000 |
| 2) | මූලික වියදම | පහන් 20 × රු.60.00<br>රු. 1200.00 | පහන් 5 × රු. 325.00<br>රු. 1625.00 | පහන් 1 × රු.2000.00<br>රු. 2000.00 |
| 3) | බලශක්ති වියදම | මුළු ආයු කාලය තුළ වැයවන මුදල<br>$\frac{(75 \times 40000 \times 20)}{1000}$<br>රු. 48000 | මුළු ආයු කාලය තුළ වැයවන මුදල<br>$\frac{(15 \times 40000 \times 20)}{1000}$<br>රු. 12000 | මුළු ආයු කාලය තුළ වැයවන මුදල<br>$\frac{(12 \times 40000 \times 20)}{1000}$<br>රු. 9600 |
| 4) | නඩත්තු වියදම | නැත | නැත | නැත |
| 5) | ආයු කාලය තුළ දරනු ලබන මුළු පිරිවැය | රු. 49200 | රු. 13625 | රු. 11600 |

ඉහත උදාහරණය අනුව මිල පිළිබඳ පමණක් සැලකීමේ දී සූත්‍රිකා පහන් ලාභදායක වුවත් ආයු කාලය තුළ දරනු ලබන මුළු පිරිවැය හෙවත් Life cycle cost පිළිබඳ සැළකීමේ දී සුසංහිත ප්‍රතිදීප්ත විදුලි පහන් (CFL) ඊට සාපේක්ෂව විශාල ලාභයක් පාරිභෝගිකයාට හිමි කර දෙයි. එමෙන්ම අතිවිශාල ලාභයක් LED විදුලි පහන් මගින් ලබා දේ.

මේ අනුව ඕනෑම විදුලි උපකරණයක් මිලදී ගැනීමට පෙර එහි ආයු කාලය තුළ දරනු ලබන පිරිවැය ගණනය කර අවශ්‍යතාව හා ඊට ගැළපෙන ධාරිතාව සහිත කාර්යක්ෂම විදුලි උපකරණ මිලදී ගැනීමෙන් ඔබේ විදුලි බිල සැමදා අඩු අගයක තබාගත හැකි වේ.

# මුළුතැන්ගෙයි බලශක්තිය පිරිමසිමු

බලශක්ති වර්ග කීපයක්ම භාවිතා කරන ස්ථානය නිවසේ මුළුතැන්ගෙයයි. එහි පිරිසිදුකම මෙන්ම බලශක්ති සංරක්ෂණයත් නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි.





## ආහාර පිසීම :

ආහාර පිසීම සඳහා වඩාත් ලාභදායකම ඉන්ධනය දර වන අතර, ගෑස් සහ විදුලිය පිළිවෙළින් මිල අධික වන ඉන්ධන වේ. අද බොහොමයක් නාගරික නිවාසවල දර භාවිතයක් නැති බැවින් LP ගෑස් විදුලියට සාපේක්ෂව ලාභදායක වේ. එහෙයින් විදුලිය ආහාර පිසීම හා ජලය උණු කිරීම සඳහා භාවිතයෙන් වැළකිය හැකි නම් ඔබටත් රටටත් විශාල ආර්ථික වාසියක් අත්වනු ඇත.

## ඇඹරුම් යන්ත්‍රය (බ්ලෙන්ඩරය) :

බ්ලෙන්ඩරය කාර්යක්ෂමව භාවිතා කිරීම උදෙසා පහත අයුරින් සැලකිලිමත් වෙමු.

## කාර්යක්ෂම භාවිතය :

1) බ්ලෙන්ඩරය භාවිතා කරන හැම විටම එහි උපරිම ධාරිතාවය සඳහා ම අමුද්‍රව්‍ය භාවිතා කරන්න.
   උදා: අඩු පොල් ප්‍රමාණයක් මිරිකා ගැනීමේ දී එය අතේ මිරිකා ගනිමු.
2) උපරිම ධාරිතාව ඉක්මවා අමුද්‍රව්‍ය දැමීමෙන් (Over loading) වළකිමු.
3) තත්පර 30 කට වරක් ක්‍රියාවිරහිත කරමින් භාවිත කිරීමෙන් උපකරණයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට මෙන්ම දිගටම ක්‍රියාකරවීමෙන් මෝටරයට සිදුවිය හැකි හානිවලින් එය ආරක්ෂා කරගැනීමට ද හැකි වේ.
4) උපකරණය නිසි ලෙස පණගන්වා එහි වේගය ක්‍රමානුකූලව උපරිම තලයට ගෙනයන්න.
5) උපකරණය භාවිතා කිරීමෙන් පසු එය පිරිසිදු කර තබන්න.
6) මෝටරයේ බෙයාරින් ගෙවුණුවිට එයින් ශබ්දය නැගේ. එසේ වුවහොත් එය නිසි ලෙස නඩත්තු කරන්න. නැතිනම් විදුලිය වැඩිපුර වැය වේ.
7) ඇඹරීමට භාවිතා කරන බඳුන්වලින් දියර කාන්දු වේ නම් ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අලුත් බඳුන් භාවිතයට ගැනීමට කටයුතු කරන්න.

## දර මඟින් ආහාර පිසීම :

ලංකාවේ තවමත් බොහොමයක් නිවාසවල ආහාර පිසීම සඳහා භාවිතා කරනු ලබන ඉන්ධනය දර වන අතර, එය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා වර්තමානයේ නිර්මාණය කර ඇති නව උදුන් වර්ග භාවිතා කිරීම තුළින් හැකි වේ.

| උදුන් වර්ගය | කාර්යක්ෂමතාවය |
|---|---|
| ගල් තුනේ ලිප | 5% - 8% |
| අනගි උදුන | 17% - 20% |
| ජීව ඉන්ධන බත් පිසිනය | 35% - 40% |

දර මඟින් ආහාර පිසීමේ දී ගල් තුනේ ළිපට වඩා නව උදුන් වර්ගයක් භාවිතා කිරීමෙන් ගෘහණියගේ සෞඛ්‍ය තත්ත්වයත් මුළුතැන්ගෙයි පිරිසිදුකමත් රැකගත හැකි වේ.

## ජීව ඉන්ධන බත් පිසිනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERD Centre) මගින් නිර්මාණය කර ඇති මෙම ජීව ඉන්ධන බත් පිසිනය (Bio mass rice cooker) විදුලි බත් පිසිනය වෙනුවට භාවිතා කිරීමෙන් කිලෝවක බතක් දිනකට දෙවරක් පිසිනු ලබන නිවසකට මාසයකට විදුලි ඒකක 15 ක් ඉතිරි කර ගත හැක.



කිලෝවක බතක් පිසීම සඳහා විදුලි බත් පිසිනයට විනාඩි 20ක් ගත වන අතර මෙම ජීව ඉන්ධන බත් පිසිනයට ඒ සඳහා විනාඩි 45 ක් පමණ ගත වේ. නමුත් ඒ සඳහා කිසිදු බලශක්ති වියදමක් නොමැත අවශ්‍ය වන්නේ නිවසින් ඉවත දමන පොල්කටු දෙකක් පමණි.

දැලි දුම් ඉතා අවම මෙම ජීව ඉන්ධන බත් පිසිනයක් රු. 5000 ක් වැනි මුදලකට දැන් වෙළෙඳපළින් මිලදී ගත හැක.

## LP ගෑස් මඟින් ආහාර පිසීම / LP ගෑස් භාවිතය :

දර උදුනට සාපේක්ෂව LP ගෑස් උදුන් ඉතා කාර්යක්ෂම අතර, සාපේක්ෂතාව ජනන අගය ද ඉහළය. මේ නිසාම මෙරට වාර්ෂිකව LP ගෑස් පරිභෝජනය 1% කින් පමණ ඉහළ යයි. 2011 වසරේදී LP ගෑස් ආනයනය මෙ.ටො 24,110 කි.

එහෙයින් ඔබ ගෑස් පරිස්සමෙන් භාවිතා කළ යුතු ය. නොඑසේ නම් එය ඔබේ ආර්ථිකයටත් රටේ ආර්ථිකයටත් අහිතකර ලෙස බලපානු ඇත.

## ගෑස් උදුනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට :

1) නිල් දැල්ල මතු කර ගනිමු
   උදුනේ යට ඇති වා කවුළුව සීරු මාරු කිරීමෙන් නිල් දැල්ල (ඔක්සිකාරක දැල්ල) මතු කරගන්න. කහ දැල්ල ඇත්නම් ගෑස් අකාර්යක්ෂම පරිභෝජනයට මඟ පාදයි.

2) හැකි සෑම විටම පීඩන උදුන් (Pressure cooker) භාවිතා කරන්න. එය ඉතා කාර්යක්ෂමය.

3) උදුනේ ප්‍රමාණයට සරිලන බඳුන් භාවිතා කරන්න.

4) ආහාර පිසින භාජනය හා දැල්ල අතර පරතරය අවම මට්ටමක තබාගන්න.

5) උදුන තුළ ඇති වා සිදුරු පිරිසිදු කර අවහිර නොවන පරිදි තබන්න.

6) ආහාර පිසීම සඳහා භාවිතා කරනු ලබන්නේ මැටි භාජන නම් ගෑස් උදුන් සඳහා නිපදවුන විශේෂ මැටි භාජන (පතුළ පැතලි හා ඝනකම අඩු) භාවිතා කරන්න.

## ආහාර පිසීමේ දී මේ ගැනත් සිතමු

1) අල වර්ග මිලදී ගන්නා විට කුඩා අල තෝරාගන්න. අල වර්ග තැම්බීමේ දී කුඩා කැබලිවලට කපා තැම්බීමෙන් තැම්බීමට ගතවන කාලය අඩු වේ.

2) ධාන්‍ය වර්ග තැම්බීමට පෙර පෙඟෙන්නට දමා තිබීමත් පෙඟීමේ දී Baking powder හෝ ආප්ප සෝඩා වැනි ද්‍රව්‍යයක් එක් කිරීමෙන් තැම්බීමට ගතවන කාලය අවම කර ගත හැක.

3) ධාන්‍ය වර්ග හා බිත්තර තැම්බීමේ දී මෙන්ම තේ සෑදීම සඳහා ජලය උණු කරන විට ද අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය භාවිතා කරන්න. තේ සෑදීමේ දී උණු ජලය ඉතිරි වන විට එය උණුවතුර බෝතලයක දමා භාවිතයට ගන්න.

4) ආහාර පිසීමේ දී බඳුන් පියනකින් වසා තැම්බීමෙන් ජලය වාෂ්ප වී යාම වළකින අතර එමගින් භාජනය තුළ වාෂ්ප වැඩි වී ආහාර පිසීම ඉක්මන් වේ.

## ආරක්‍ෂාව වැදගත් :

- ගෑස් සිලින්ඩර ප්‍රවාහනයේ දී හා නිවසේ තැන්පත් කිරීමේ දී සිලින්ඩරය සිරස්ව (උඩ අතට හරවා) තබන්න.
- සෑම සිලින්ඩර මාරුවකදීම එහි ඇති රෙගියුලේටරය නිසි පරිදි තිබේ දැයි බලන්න.
- සිලින්ඩරයේ සිට ගෑස් උදුන කරා ගෑස් සම්ප්‍රේෂණය කරනු ලබන නලය පළුදු වී ඇත්දැයි නිතර පරීක්‍ෂා කර බලන්න.
- ගෑස් උදුන දැල් වී ඇති අවස්ථාවල ගෑස් සුවඳ දැනේ නම් වහාම උදුන අලුත්වැඩියා කරන්න. නැතිනම් ගෑස් නිකරුණේ අපතේ යනු ඇත.
- මුළුතැන්ගෙයි ගෑස් සුවඳ ඇතිනම් සිගරැට්, ලයිටර් වැනි දෑ භාවිතා නොකරන්න.
- රෙගියුලේටරය කරකවා ගෑස්, උදුනට එන මාර්ගය වසන්න.

# බලශක්ති වියදම් දර්ශකය

නිවසේ බලශක්ති කළමනාකරණ මට්ටම හඳුනාගැනීමට බලශක්ති වියදම් දර්ශකය භාවිතා කිරීම තුළින් හැකි වේ.

ඔබේ නිවසේ මාසික බලශක්ති වියදමට මුළු වියදම දරන අනුපාතය බලශක්ති වියදම් දර්ශකය නම් වේ.

ඔබගේ බලශක්ති වියදම් දර්ශකය සොයාගැනීමේ අත්‍යවශ්‍ය නිර්ණායකයන් වන බලශක්ති වියදම හා මුළු වියදම සොයාගැනීම සඳහා පහත සඳහන් වගු භාවිතා කරන්න.

## බලශක්ති වියදම් දර්ශකය

| | |
|---|---|
| පවුලේ මාසික ආදායම : | රු.---------------- |
| පවුලේ මාසික වියදම : | රු.---------------- |
| විදුලි බිල | රු.---------------- |
| ඩීසල්/භූමිතෙල්/LPG | රු.---------------- |
| දර | රු.---------------- |
| බදු කුලිය | රු.---------------- |
| දුරකතන බිල | රු.---------------- |
| ආහාර සඳහා | රු.---------------- |
| ජල බිල්පත | රු.---------------- |
| ඇඳුම් සඳහා | රු.---------------- |
| ප්‍රවාහන වියදම් | රු.---------------- |
| වෙනත් | රු.---------------- |
| එකතුව | රු.---------------- |

**බලශක්ති වියදම**

2. බලශක්ති පරිභෝජනය :

මාසය --------------                    වර්ෂය :-----------------

| | |
|---|---|
| විදුලි බිල | (ඒකක) kWh |
| LPG | ------------ kg |
| භූමිතෙල් | ------------ liter |
| ඩීසල් | ------------ liter |
| පෙට්‍රල් | ------------ liter |
| දර | ------------ kg |
| වෙනත් | ------------ |

| | | | |
|---|---|---|---|
| මාසික ආදායම | = | A | රු.---------------- |
| මාසික වියදම | = | B | රු.---------------- |
| මාසික බලශක්ති වියදම | = | C | රු.---------------- |
| බලශක්ති වියදම දර්ශකය | = | D= C/B | |

## සටහන් :

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

# විදුලිබල ගාස්තු සංශෝධනය - 2022 අගෝස්තු

2022 අගෝස්තු මස සිට ක්‍රියාත්මක කෙරෙන විදුලිබල ගාස්තු අය ක්‍රමය පහත සඳහන් පරිදි වේ.

## මාසික විදුලි පරිභෝජනය ඒකක 0 - 60 දක්වා

| පාරිභෝගික කාණ්ඩය හා මාසික පරිභෝජනය (කිලෝ වොට් පැය (kWh) | ඒකකයක මිල (කිලෝ වොට් පැයට රුපියල් ) | ස්ථාවර ගාස්තුව (මසකට රුපියල් ) |
|---|---|---|
| 0 - 30 | 8.00 | 120 |
| 31 - 60 | 10.00 | 240 |

## මාසික විදුලි පරිභෝජනය ඒකක 60 ඉක්මවන අවස්ථාවේදී

| පාරිභෝගික කාණ්ඩය හා මාසික පරිභෝජනය (කිලෝ වොට් පැය (kWh) | ඒකකයක මිල (කිලෝ වොට් පැයට රුපියල් ) | ස්ථාවර ගාස්තුව (මසකට රුපියල් ) |
|---|---|---|
| 0 - 60 | 16.00 | 240 |
| 61 - 90 | 16.00 | 360 |
| 91 - 120 | 50.00 | 960 |
| 121 - 180 | 50.00 | 960 |
| 180 ට වඩා වැඩි | 75.00 | 1500 |

## විදුලි බිල හැදෙන්නේ මෙහෙමයි

### 1) විදුලි පරිභෝජනය ඒකක 30 නම්

| | | |
|---|---|---|
| මුල් ඒකක 30 සඳහා රු. 8.00 x 30 | රු. | 240.00 |
| ස්ථාවර ගාස්තුව | රු. | 120.00 |
| | **රු.** | **360.00** |

### 2) විදුලි පරිභෝජනය ඒකක 60 නම්

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඒකක 60 සඳහා | රු. 8.00 x 30 | රු. | 240.00 | | | |
| | රු.10.00 x 30 | රු. | 300.00 | රු. | 540.00 |
| ස්ථාවර ගාස්තුව | | | | රු. | 240.00 |
| | | | | **රු.** | **780.00** |

### 3) විදුලි පරිභෝජනය ඒකක 61 නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒකක 61 සඳහා | රු. 16.00 x 60 | රු. | 960.00 | | |
| | රු. 16.00 x 1 | රු. | 16.00 | රු. | 976.00 |
| ස්ථාවර ගාස්තුව | | | | රු. | 360.00 |
| | | | | **රු.** | **1336.00** |

### 4) විදුලි පරිභෝජනය ඒකක 90 නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒකක 90 සඳහා | රු. 16.00 x 60 | රු. | 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. | 480.00 | රු. | 1440.00 |
| ස්ථාවර ගාස්තුව | | | | රු. | 360.00 |
| | | | | **රු.** | **1800.00** |

### 5) විදුලි පරිභෝජනය ඒකක 91 නම්

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒකක 90 සඳහා | රු. 16.00 x 60 | රු. | 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. | 480.00 | | |
| | රු. 50.00 x 1 | රු. | 480.00 | රු. | 1490.00 |
| ස්ථාවර ගාස්තුව | | | | රු. | 960.00 |
| | | | | **රු.** | **2450.00** |

### 6) විදුලි පරිභෝජනය ඒකක 120 නම්

| | | | | |
|---|---|---|---|---|
| ඒකක 120 සඳහා | රු. 16.00 x 60 | රු. 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. 480.00 | | |
| | රු. 50.00 x 30 | රු. 1500.00 | රු. | 2940.00 |
| ස්ථාවර ගාස්තුව | | | රු. | 960.00 |
| | | | **රු.** | **3900.00** |

### 7) විදුලි පරිභෝජනය ඒකක 121 නම්

| | | | | |
|---|---|---|---|---|
| ඒකක 120 සඳහා | රු. 16.00 x 60 | රු. 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. 480.00 | | |
| | රු. 50.00 x 30 | රු. 1500.00 | | |
| | රු. 50.00 x 1 | රු. 50.00 | රු. | 2990.00 |
| ස්ථාවර ගාස්තුව | | | රු. | 960.00 |
| | | | **රු.** | **3950.00** |

### 8) විදුලි පරිභෝජනය ඒකක 180 නම්

| | | | | |
|---|---|---|---|---|
| ඒකක 120 සඳහා | රු. 16.00 x 60 | රු. 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. 480.00 | | |
| | රු. 50.00 x 30 | රු. 1500.00 | | |
| | රු. 50.00 x 60 | රු. 3000.00 | රු. | 5940.00 |
| ස්ථාවර ගාස්තුව | | | රු. | 960.00 |
| | | | **රු.** | **6900.00** |


### 9) විදුලි පරිභෝජනය ඒකක 181 නම්


| | | | | | |
|---|---|---|---|---|---|
| ඒකක 181 සඳහා | රු. 16.00 x 60 | රු. | 960.00 | | |
| | රු. 16.00 x 30 | රු. | 480.00 | | |
| | රු. 50.00 x 30 | රු. | 1500.00 | | |
| | රු. 50.00 x 60 | රු. | 3000.00 | | |
| | රු. 75.00 x 1 | රු. | 75.00 | රු. | 6015.00 |
| ස්ථාවර ගාස්තුව | | | | රු. | 1500.00 |
| | | | | රු. | 7515.00 |

ඊළඟ පිටේ සඳහන් වගුවෙන් දැක්වෙනුයේ නිවසේ භාවිතා කරනු ලබන විදුලි උපකරණයන් හා ඒවායේ සාමාන්‍ය විදුලි පරිභෝජන ධාරිතාවයයි. එමෙන්ම එම විදුලි උපකරණ දිනපතා භාවිතා කිරීමෙන් මාසික විදුලි බිලට එක්වන විදුලි ඒකක ප්‍රමාණයයි.

ඒ අනුව ඔබේ නිවසේ ඇති විදුලි උපකරණයන්හි විදුලිබිල ධාරිතාව සටහන් වී නොමැති අවස්ථාවල මෙම සාමාන්‍ය ප්‍රමාණය සලකා බලා ඔබ සාමාන්‍යයෙන් දිනකට භාවිතා කරන පැය ගණන අනුව ඔබේ නිවසේ විදුලි බිලට ඒ ඒ උපකරණ මඟින් දක්වන දායකත්වය ගණන් බලා ගන්න.

| කාර්යය | විදුලි උපකරණය | වොට් ප්‍රමාණය | දිනකට සාමාන්‍යයෙන් පාවිච්චි කරන පැය ගණන | මාසයක් තුළ දැවී යන විදුලි ඒකක ගණන |
|---|---|---|---|---|
| ආලෝකකරණය | සූත්‍රිකා විදුලි පහන් | 75 | 4 | 9 |
| | ප්‍රතිදීප්ත පහන් (Tube Lights) | 40 | 4 | 5 |
| | සුසංහිත ප්‍රතිදීප්ත පහන් (CFL) | 15 | 4 | 2 |
| | LED | 5 | 4 | 0.6 |
| සන්නිවේදනය සඳහා | රූපවාහිනී යන්ත්‍රය (කළු-සුදු) | 40 | 4 | 5 |
| | රූපවාහිනී යන්ත්‍රය (වර්ණ) | 100 | 4 | 12 |
| |ගුවන් විදුලි යන්ත්‍රය | 40 | 4 | 4.8 |
| | ඩෙස්ක්ටොප් පරිඝනකය | 80/150 | 4 | 9.6 / 18 |
| | ලැප්ටොප් පරිඝනකය | 20/50 | 4 | 2.4 / 6 |
| | දුරකථන චාජරය | 05 | 2 | 0.15 |
| ජලය රත් කිරීම | විදුලි කේතලය | 1500 | 1/2 | 23 |
| | ජල රත්කරණය (Geezer) | 3000 | 1/4 | 23 |
| | ගිල්වන විදුලි තාප දඟරය | 1000/1500 | 1/2 | 15/23 |
| ආහාර පිසීම | ඇඹරුම් යන්ත්‍රය | 250 | 1/4 | 2 |
| | විදුලි උදුන | 4000 | 1 1/2 | 180 |
| | බත් පිසින උදුන | 600 | 1/2 | 9 |
| ආහාර කල්තබා ගැනීම හා සිසිල් කිරීම | ශීතකරණය | 130 | 15 | 58 |
| | අධි ශීතකරණය | 120 | 16 | 58 |
| පරිසරය සිසිල් කිරීම | මේස විදුලි පංකාව | 40 | 8 | 10 |
| | සීලිං විදුලි පංකාව | 75 | 8 | 18 |
| | වායු සමන යන්ත්‍ර (A/C) (Small window unit) | 1100 | 8 | 265 |
| රෙදි සේදීම හා මැදීම | රෙදි සෝදන යන්ත්‍රය | 1500 | 1/4 | 11 |
| | වියලනය | 500 | 1/4 | 4 |
| | විදුලි ඉස්ත්‍රික්කය | 750 | 1/3 | 7-8 |
| වෙනත් | බිම ඔප දමන යන්ත්‍රය | 500 | 1/4 | 4 |
| | දූවිලි ඉවත් කරන යන්ත්‍රය | 850 | 1/4 | 6 |


1. අදාල මාසයෙහි බිල්පත
2. ගිණුම් අංකය
3. නම සහ ලිපිනය
4. ගාස්තු
5. අවසාන මසට බිල
6. පසුගිය මාසය සඳහා බිල් ගාස්තුව
7. පසුගිය මස ඒකක ප්‍රමාණය
8. පසුගිය මස ඒකක ප්‍රමාණය සඳහා අයකිරීම
9. අවසාන ගෙවීම කළ මාසය සහ මුදල
10. වර්තමාන ගිණුමෙහි ශේෂය
11. මීටර් අංකය
12. මීටරය සටහන් කළ දිනය සහ දත්ත
13. අවසන් වරට මීටරය සටහන් කළ දිනය සහ දත්ත
14. පරිභෝජනය කළ ඒකක ප්‍රමාණය
15. පරිභෝජනය කළ විදුලි ඒකක ප්‍රමාණයට අයකිරීම්
16. ගෙවූ මුදල
17. බිල්පත මුද්‍රණය කළ දිනය
18. අවසන් ගෙවීම කළ ස්ථාවර මුදල
19. පාවිච්චි කළ විදුලි ඒකක සඳහා අයකිරීම
20. අවසන් බිලට සැපයුම් පිරිවැය
21. අවසන් බිලට රාජ්‍ය සහනාධාර වට්ටම්
22. බැංකු ශාඛාව සහ පිටපත
Ceylon Electricity Board
Statement of Electricity Account
JUL-2017
C-41-P-009
D-1
HML0523
HOMAGAMA
30-20-043.00
4116178500
WPS 2
A L K MARASINGHE
1142/28/B, SIRI UYANA,
KATUKURUNDA,
KOTTAWA, PANNIPITIYA.
30
1-30 | 31-60 | 61-90 | 91-120 | 121-125
30 | 30 | 30 | 30 | 5
7.85 | 7.85 | 10.00 | 27.75 | 32.00
2,239.85
3.65CR + 2,243.50
2,239.85
17-07-17
2,239.85
Meter Reading
Date
4750800
17-06-26
2063
0.00
125
1,763.50
480.00
0.00
2,243.50
2,700.00
456.50
Enrich Life through Power
PRINT 17/07/18
Meter Reader
Please do not detach
Payment by
Cash
Credit Card
Cheque
12
JUL-2017
17,841
4116178500
A/C No: 4116178500
Amount paid (Rs)
Cashier
CEB Cashier


1. බිල්පත මුද්‍රණය කළ දිනය
2. අයපත් දිනය
3. ගාස්තුව
4. ගිණුම් අංකය
22. බැංකු ශාඛාව සහ පිටපත
5. නම සහ ලිපිනය
6. මීටර් අංකය
7. මීටරය සටහන් කළ දිනය සහ දත්ත
8.අවසාන මාසයෙහි මීටරය සහ දත්ත
9. පරිභෝජනය කළ ඒකක ගණන
10. විදුලි පරිභෝජනය සඳහා අයකිරීම
11. දැනට පවත්නා ශේෂය
12. ගෙවූ මුදල
13. අවසන් බිල්ගත වූ එකතුව ගණන සහ මුදල
14. අවසන් බිලේහි පරිභෝජනය කළ ඒකක ගණන
15. අවසන් ගෙවීම සහ දිනය
16. අවසන් බිලට අයකිරීම සහ ඒකක ගණන
17. අවසන් බිලෙහි ස්ථාවර ගාස්තු
18. අවසාන බිලෙහි බිල්පත් වටිනාකම
19. අවසාන බිලෙහි සැපයුම් පිරිවැය
20. අවසාන බිල්ගත කිරීමේදී රාජ්‍ය සහනාධාර
21. ගාස්තු ක්‍රමයට අනුව අවසාන බිලයට අයකිරීම
LANKA ELECTRICITY CO. (PRIVATE) LTD.
Bill Print Date 13/07/18
Invoice No ****1606048694
Rev./Mr./Ms. WIJEYA JAYASURIYA,
118/62, SAPUMAL PLACE,
RUKMALE, PANNIPITIYA
A/C Number ****419807
ELECTRICITY BILL
Billing Cycle 201606
Tariff D1
CUSTOMER COPY
Meter Nos. 3722231
Date / Meter Reading
07/18
16/06/18 15952
Units
Meter Change Units
Total Units / Amount
kWh Rs.
Adjustment Rs.
Surcharge for late Payment Rs.
Loan Instalment Rs.
Total amount for this month Rs.
Account Balance as at 10/07/18 Rs. -40.36
Amount Payable Rs.
Last Month Bill Calculation
Units Consumed 143
No of days 28
Tariff block | Unit rate | Units consumed | Total charges (Rs.)
0 - 56 | 7.85 | 56 | 439.60
57 - 84 | 10.00 | 28 | 280.00
85 - 112 | 27.75 | 28 | 777.00
113 - 143 | 32.00 | 31 | 992.00
Charges for units consumed 2488.60
Fuel adjustment charge
Fixed charge 480.00
Total bill value 2968.60
Total cost for supply 2980.12
Subsidies by GOVT 11.52
SMS Service
For more details type 'inf' and send a SMS to 0714 643643
Notice of Disconnection
Regret to inform that, failure to settle outstanding amount of Rs. within 10 days from the date of issue of this bill will result in disconnection of your electricity supply without any further notice.
Disconnection notice No.
Revenue Officer
Last Payment (Rs.) 3000.00
Date 23/06/18
Pole No: POLE NOT FOUND
Transformer No: B20423
Payment / Date
Cashier
Electricity bill can be paid at Branch Office from 8.30 a.m. to 4.30 p.m. by cash, cheque or credit card (Amex or HSBC)
1910
For customer complaints / Requests contact 24 Hours service call centre
BRANCH / BANK COPY
Bill Print Date 13/07/18
Invoice No ****1606048694
Billing Cycle: 201606
A/C Number ****419807
Payment
Rs. / Date
Cash / Cheque / Credit Card
Cheque No / Card No
Bank
Exp. Date of Credit Card
Customer Signature
Cashier
If bill is paid prior to due date, adding of late fee / security deposit and disconnection of Supply can be avoided. Draw your attention to the overleaf for details of payment centre and more instructions.
Visit our web site to pay your bills online and get more details.
www.leco.lk
01
01
DESIGNED & PRINTED BY : DIAWEB & FORMS (PVT) LTD. JN 10366

# විදුලිබිල කළමනාකරණයට සූර්ය බලශක්තිය



ඉහත සඳහන් කල පරිදි නිවසේ බලශක්ති භාවිතය කාර්යක්ෂමව කර ගැනීම තුළින් ඔබේ නිවසේ විදුලිබිල මෙන්ම අනෙකුත් බලශක්ති වියදම් ද 10%ත් 20% ත් අතර ප්‍රමාණයකින් අඩුකර ගත හැකිය. නමුත් විදුලිබිල තවත් අඩු කර ගැනීමට අවශ්‍යනම් එය කළ හැක්කේ විකල්ප පුනර්ජනනීය බලශක්ති භාවිතයට යොමු වීම තුළින් පමණි.

දැනට ඒ සඳහා සුදුසු පහසු හා ලාභදායී විකල්පය නම් තම නිවසේ පියස්ස මත සූර්ය බල පද්ධතියක් සවි කර ගැනීමයි.

පියසි මත සූර්ය විදුලිබල නිෂ්පාදනය සඳහා රජය විසින් ප්‍රධාන ක්‍රම හඳුන්වා දී ඇත.

### 1. ශුද්ධ මණුකරන ක්‍රමය (Net Metering)

තම නිවසේ වහල මත සවිකරනු ලබන සූර්යබල කට්ටල මගින් නිපදවෙන විදුලිය ප්‍රමාණය නිවසේ මාසිකව පරිභෝජනය කරනු ලබන විදුලි ඒකක ප්‍රමාණයට වඩා අඩුනම් එම වෙනසට පමණක් මුදල් ගෙවිය යුතුය. එමෙන්ම පරිභෝජනයට වැඩි ජනනයක් සිදු වුයේ නම් එය අනාගත පරිභෝජනය සඳහා (වසර 10ක් දක්වා) ශේෂයක් ලෙස ඉදිරියට ගෙනයාම මෙම ක්‍රමය මගින් හඳුන්වා දී ඇත.

### 2. ශුද්ධ ගිණුම්කරණ ක්‍රමය (Net Accounting)

තම නිවසේ වහල මත සවි කරනු ලබන සූර්ය විදුලි බල කට්ටලය මගින් නිපදවන විදුලිය නිවසේ පරිභෝජනය කරනු ලබන විදුලි ඒකක ප්‍රමාණයට වඩා අඩුවන විට එම වෙනසට පමණක් මුදල් ගෙවීම හෝ නිපදවන විදුලිය පරිභෝජනයට වඩා වැඩි වන්නේ නම් විදුලිබල මණ්ඩලය හෝ ලෙකෝ ආයතනය මගින් එම අතිරික්තය සඳහා මුදල් ලබා ගැනීම මෙම ක්‍රමයේදී සිදු වේ.

### 3. නෙට් ප්ලස් ක්‍රමය (Net Plus)

තම නිවසේ වහල මත සවි කරනු ලබන සූර්ය බල කට්ටලය මගින් නිපදවෙන විදුලිය ඍජුවම ජාතික විදුලි බල පද්ධතියට ලබා දී ඒ සඳහා විදුලි බල මණ්ඩලයෙන් හෝ ලෙකෝ ආයතනයෙන් මුදල් ලබා ගැනීම, මෙම ක්‍රමයේදී සිදු වන අතර තම නිවසේ විදුලි බිල්පත දැනට ගෙවන ක්‍රමයට විදුලි පාරිභෝගිකයා විසින් ගෙවාගෙන යාම නෙට් ප්ලස් ක්‍රමයයි. ඉහත (2) සහ (3) ක්‍රමවලදී ගෘහස්ත විදුලි නිෂ්පාදකයන්ට විදුලිබල මණ්ඩලය හෝ ලෙකෝ ආයතනය මගින් පළමු වසර 7 තුළ ඒකකයකට රු. 22 ක් හා 8 වන වසරේ සිට 20 වන වසර දක්වා රු. 15.50 බැගින් මුදල් ලබා ගත හැකිය. (මෙම ගෙවීම් නව ඉදිකිරීම් සඳහා වරින් වර සංශෝධනය වන අතර ගිවිසුම් ගතවූ පාරිභෝගිකහිමියන්ගේ ගෙවීම් වසර 20ක් සඳහා වෙනස් නොවේ.)

## සූර්යබල පද්ධතියක් සවිකර ගැනීමේදී අවධානය යොමුකළ යුතු ප්‍රධාන කරුණු

■ ඔබගේ වහලය අදාල සූර්ය පැනල පද්ධතිය දරා ගැනීම සඳහා ශක්තිමත් විය යුතුය. මේ සඳහා පිළිගත් ගොඩනැගිලි ව්‍යුහ ඉංජිනේරුවරයකුගේ (Structural Engineer) හෝ සුදුසුකම්ලත් කාර්මික නිලධාරියෙකුගේ සහාය ලබා ගත හැකිය.

■ එමෙන්ම වහලය මතට දවසේ වැඩි කාලයක් හිරු එළිය ප්‍රමාණවත් පරිදි වැටිය යුතුය. විශේෂයෙන් වහලයේ දකුණු පියස කාර්යක්ෂතම විදුලි උත්පාදන පියස බැවින් ඉතා පැහැදිලි හිරුඑළිය සහිත වීම (සෙවනැලි පතිත නොවීම) කාර්යක්ෂම විදුලි නිෂ්පාදනයට මඟ පාදයි. නමුත් අනෙකුත් පියසි ද සූර්ය විදුලිබල නිෂ්පාදන ඒකක සවි කිරීම සඳහා භාවිතා කළ හැකි අතර ඒවායේ කාර්යක්ෂමතාවය දකුණු පියසට සාපේක්ෂව අඩු අගයක් ගනී.

එමෙන්ම පියස්ස මත සූර්ය පැනල සවි කිරීමේදී එහි ආනතිය අංශක 7 ක් 10 ක් අතර තබාගත හැකිනම් උපරිම කාර්යක්ෂමතාවය ලබා ගත හැකිය. සූර්යබල පැනල සවිකරනු ලබන වහලයේ ආනතිය අනුවද සූර්ය ශක්ති උත්පාදනය වෙනස් වේ. දූවිලි සහිත ප්‍රදේශයක නිවස පිහිටා ඇත්නම් මෙම ආනතිය අංශක 15ක මට්ටමේ තබා ගැනීමෙන් වැසි ජලය මාර්ගයෙන් ඉබේම පිරිසිදු වීමේ වාසිය නිවෙස් හිමියාට අත්වේ.

■ සූර්යබල පද්ධති ආනයනය, බෙදාහැරීම හා සවිකිරීමේ කටයුතු සිදුකරන සියළු ආයතන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වේ. එහෙත් ඔබට නිත්‍යානුකූල ආයතන පිළිබඳ දැනගැනීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වෙබ් අඩවියට (www.energy.gov.lk) පිවිසීම තුළින් හැකි වේ.

## නිවසට ප්‍රමාණවත් සූර්යබල පද්ධතියක් තෝරා ගැනීම

සාමාන්‍යයෙන් සූර්ය බල පද්ධති කි.වො. 1 ප්‍රමාණයේ සිට ඉහළට පවතී. එහෙත් එකලා (Single phase) විදුලිය සැපයුමක් ඇති නිවසක් සඳහා විදුලිබල මණ්ඩලය හා ලෙකෝ ආයතනය මගින් අනුමැතිය ලබා දෙනු ලබන්නේ කිලෝ වොට් 7 ප්‍රමාණය දක්වා ධාරිතාව සහිත කට්ටල පමණි. ප්‍රායෝගිකව ආයතන විසින් සවිකරණ ලබන්නේ අවම වශයෙන් කි. වො. 2ක ධාරිතාවය සහිත පද්ධති වේ. නමුත් තෙකලා (Three phase) විදුලිය පවතින ආයතන නිවෙස් සඳහා ඉහත ආයතන හා සාකච්ඡා කර වහලේ යෝග්‍යතාවය අනුව ඔබට ලබාගත හැකි පද්ධතියේ ධාරිතාව තීරණය කළ හැකිය. තෙකළා පද්ධති සඳහා ලබාගත හැකි ධාරිතාව කිලෝවොට් 42 කි.

පහත සමීකරණය භාවිතා කිරීමෙන් සූර්ය බල පද්ධතියක් මගින් දිනකට නිපදවන විදුලි ඒකක ගණන (kWh) සොයාගත හැක.

| | | | | |
|---|---|---|---|---|
| **සූර්ය විදුලි පද්ධතිය මගින් දිනකට නිපදවන විදුලි ඒකක (kWh) ගණන** | **=** | **සූර්යබල පද්ධතියේ ධාරිතාවය (කි. වො.),** | X | 4 |

(ශ්‍රී ලංකාව සැලකූවිට මෙම සංගුණකය 3-6 අතර අගයන් පෙන්වා ඇති අතර සාමාන්‍ය තක්සේරුවක් සඳහා එම සංගුණකය 4 සේ සැළකිය හැක.)

උදා - කි.වො. 1 ක සූර්ය විදුලි පද්ධතිය මගින් දිනකට නිපදවන විදුලි ඒකක (kWh) ගණන = 1 x 4 = 4

ඒ අනුව මසකට නිපදවන විදුලි ඒකක (kWh) ගණන = 4 x 30 = 120

(නමුත් මෙය ප්‍රදේශය අනුවද, කාලගුණ තත්වයන් මතද යම් තරමකට වෙනස් වේ. වළාකුළු ගහණ ශීත දේශගුණය සහිත ප්‍රදේශයක මෙය 90ක් තරම්ද, පරිසර උෂ්ණත්වය අඩු, මනා හිරුරැස් පතිතවන ප්‍රදේශයක මෙය 150 වැනි ඉහල අගයක් ද ගන්නා බව වාර්තා වී ඇත.)

**ඔබට උවමනා ධාරිතාවය (කි. වො.) අනුව අවශ්‍ය වහලයේ වර්ග අඩි ප්‍රමාණය ගණනය කිරීම**

කිලෝ වොට් 1 ක ධාරිතාවක් සවි කිරීම සඳහා වර්ග මීටර 6 ක ප්‍රමාණයක පියසක් අවශ්‍ය වේ. ඒ අනුව ඔබේ නිවසේ සවි කරනු ලබන සූර්ය බල පද්ධතියේ ධාරිතාවය අනුව පියසේ ඉඩකඩ ප්‍රමාණය පහත අයුරු ගණනය කළ හැක.

| | | | | |
|---|---|---|---|---|
| **සූර්ය බල පද්ධතියේ සවි කිරීමට අවශ්‍ය වර්ග ප්‍රමාණය** | **=** | **කිලෝ වොට් 1 ට අවශ්‍ය වර්ග ප්‍රමාණය ($6m^2$)** | X | **ඔබට අවශ්‍ය කිලෝ වොට් ප්‍රමාණය** |

උදා - ඉහත සමීකරණය භාවිතයෙන් ඔබට කි.වො. 3 ක ධාරිතාවයක් සහිත සූර්ය බල පද්ධතියක් සවිකිරීමට අවශ්‍ය වහලේ වර්ග මීටර ප්‍රමාණය පහත අයුරු ගණනය කළ හැක.

සූර්ය බල කට්ටලය සවි කිරීමට අවශ්‍ය වහලයේ වර්ග මීටර ප්‍රමාණය
= 6 x කිලෝ වොට් 3
= වර්ග මීටර ($m^2$) 18

ඉහත ආකාරයට සූර්ය බල පද්ධති පිළිබඳ දැනුවත් වූ ඔබ ඔබේ නිවසේ විදුලි පරිභෝජනයට හා ඔබේ ආර්ථිකයට ගැළපෙන සූර්ය බල කට්ටලයක් සවිකර ගැනීම තුළින් ඔබේ ආර්ථිකයටත් රටේ ආර්ථිකයට මෙන්ම වර්තමානයේ රට තුළ ගොඩනැගී ඇති බලශක්ති අර්බුදයට මුහුණදීමට මහත් පිටුබලයක් ලැබෙනු ඇත.

# අඩු විදුලි බිලකට මඟ

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
නො. 72 ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 07.

www.energy.gov.lk